# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## පැවරුම් ශීර්ෂය: වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP) සඳහා වෙනස්කම් කළමනාකරණය, සන්නිවේදනය සහ ධාරිතා වර්ධනය පිළිබඳ උපදේශන ආයතනයක් තෝරා ගැනීම.

# අභිලාෂ ප්‍රකාශ කිරීම සඳහා ආරාධනාව (EOI)

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකම් සැලසීමේ ගිවිසුම (WTO-TFA) යටතේ ශ්‍රී ලංකා රජයට ඇති බැඳීම්වලට අනුකූලව සහ UN/CEFACT නිර්දේශයන්ට අනුව, ශ්‍රී ලංකා රජය විසින් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතිය (TNSWS) ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ජාතික ඩිජිටල් වේදිකාව මගින් වෙළඳුන්ට සියලුම අපනයන, ආනයන සහ ප්‍රතිඅපනයන ලේඛන තනි අන්තර්ජාල ද්වාරයක් හරහා යොමු කිරීමට අවස්ථාව හිමිවේ.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DTIP) යටතේ ස්ථාපිත කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) මගින්, ප්‍රායෝගික තත්ත්වයන්ට ගැලපෙන වෙනස්කම් කළමනාකරණය, සන්නිවේදනය සහ ධාරිතා වර්ධන වැඩසටහන් මාලාවක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා පළපුරුදු දේශීය උපදේශන ආයතනයක් සම්බන්ධ කර ගැනීමට අදහස් කරයි.

**පැවරුමෙහි අරමුණ**

මෙම උපදේශනයේ අරමුණ වන්නේ, රජයේ දේශසීමා ආයතන සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් අතර ශ්‍රී ලංකා ජාතික තනි කවුළු පද්ධතිය (TNSWS) සුමට ලෙස සංක්‍රමණය කිරීම, සාර්ථකව අනුගත කරගැනීම සහ දීර්ඝකාලීන පවත්වාගෙන යාම තහවුරු කිරීමයි. සැකසුම්ගත වෙනස්කම් කළමනාකරණය, උපායමාර්ගික සන්නිවේදනය සහ ඉලක්කගත ධාරිතා වර්ධන මුලපිරීම් හරහා, ශ්‍රී ලංකාවේ වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියේ සඳහා මිනිසුන්, ක්‍රියාවලීන් සහ ආයතන පරිපූර්ණ ලෙස සූදානම් කර ඇති බව මෙම පැවරුම මගින් තහවුරු කරනු ඇත.

වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය වෙනුවෙන් අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව (CPCM) විසින් ඉහත පැවරුම සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීම් (EOI) ඉදිරිපත් කරන ලෙස සුදුසුකම්ලත් උපදේශන ආයතනවලින් ඉල්ලා සිටියි.

**කෙටි ලැයිස්තුගත කිරීමේ නිර්ණායක**

උපදේශන ආයතන විසින් තම ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍රය, මෙහෙයුම් කාල සීමාව (වසර ගණන), මූල්‍ය තත්ත්වය සහ පාලන ධාරිතාව පිළිබඳ ලේඛනමය සාක්ෂි සැපයිය යුතුය. වෙනස්කම් කළමනාකරණය, සන්නිවේදනය සහ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීමේ සාර්ථක පූර්ව පළපුරුද්ද මෙන්ම සමාන ස්වභාවයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර පළපුරුද්ද ඇති දක්ෂ වෘත්තිකයින්ගේ අනුබද්ධතාවය ද පෙන්වා දිය යුතුය. ත්‍රිභාෂා සේවා සැපයීමේ පරිසරයක වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති ආයතන සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය: රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2007 (උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම) අනුව ගුණාත්මකභාවය සහ පිරිවැය මත පදනම් වූ තේරීම් (QCBS) ක්‍රමය යටතේ සිදු කෙරේ.

**EOI ඉදිරිපත් කිරීමේ විස්තර**

1. නියමිත සවිස්තරාත්මක අවශ්‍යතා සඳහා කරුණාකර යොමු අනුදේශ (TOR) පරිශීලනය කරන්න.
2. යොමු අනුදේශ (TOR) සහ EOI ඉදිරිපත් කිරීමේ ආකෘතිය බාගත කිරීම සඳහා OneTrade වෙබ් අඩවියට (**www.onetrade.lk**) පිවිසෙන්න, නැතහොත් **nsw@tipd.treasury.gov.lk** විද්‍යුත් තැපෑල හරහා ප්‍රසම්පාදන විශේෂඥගෙන් වැඩිදුර තොරතුරු ලබා ගන්න.
3. උනන්දුවක් දක්වන උපදේශන ආයතන විසින් නියමිත ආකෘති පත්‍ර (EOI තොරතුරු ආකෘති පත්‍රය ඇතුළුව) සහ පහත දැක්වෙන ලේඛන සමග EOI ඉදිරිපත් කළ යුතුය:
   i. ආයතනයේ වලංගු ව්‍යාපාර ලියාපදිංචිය සහ නීතිමය තත්ත්වය.
   ii. උපදේශන ආයතනයේ සාමාන්‍ය පළපුරුද්ද (අවම වශයෙන් වසර 10ක්) සහ සුදුසුකම්.
   iii. පසුගිය වසර 05 ඇතුළත, එකතු කළ අගය ශ්‍රී ලංකා රුපියල් මිලියන 30ක් වන සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයෙන් යුත් ව්‍යාපෘති අවම වශයෙන් තුනක් (03) සාර්ථකව නිම කළ බවට ලේඛනමය සාක්ෂි.
   iv. ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රධාන වෘත්තීය කාර්ය මණ්ඩලයේ සුදුසුකම්, පළපුරුද්ද සහ හැකියාවන්.
   v. පසුගිය/අවසාන අනුප්‍රාප්තික වසර 3 තුළ ශ්‍රී ලංකා රුපියල් මිලියන 100ක වාර්ෂික පිරිවැටුමක් පැවතීම ඇතුළත් ආයතනයේ මූල්‍ය ශක්තිය.
   vi. බද්ධ ව්‍යාපාර (JV) ලෙස ඉදිරිපත් කරන්නේ නම්: ඇටෝර්නි බලපත්‍රය (නොතාරිස් කළ හෝ සුදුසු බලධාරියෙකු විසින් සහතික කළ); එහි සියලුම පාර්ශවයන් අත්සන් කළ ප්‍රතිඥාවක් ඇතුළත් විය යුතුය: (i) සියලුම පාර්ශවයන් ඒකාබද්ධව සහ වෙන් වෙන්ව වගකිව යුතු බව ප්‍රකාශ කිරීම, සහ (ii) ලංසු තැබීමේ ක්‍රියාවලියේදී සහ කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබුවහොත් එය ක්‍රියාත්මක කිරීමේදී බද්ධ ව්‍යාපාරයේ හ සියලුම පාර්ශවයන් වෙනුවෙන් කටයුතු කිරීමට බලය ඇති නියෝජිතයෙකු නම් කිරීම. TOR හි දක්වා ඇති පරිදි එක් එක් පාර්ශවය දරන වැඩසටහන් ප්‍රතිඵල සහ ශ්‍රම මට්ටම (Level of Effort) පැහැදිලිව දක්විය යුතුය.
4. සම්පූර්ණ කරන ලද EOI පහත පරිදි ඉදිරිපත් කළ යුතුය:
   - එක් (01) මුල් පිටපතක් ("ORIGINAL") ලෙස පැහැදිලිව සටහන් කළ යුතුය)
   - අනුපිටපත් දෙකක් (02) ("COPY") ලෙස පැහැදිලිව සටහන් කළ යුතුය)
   - එක් (01) මෘදු පිටපතක් (USB ඩ්‍රයිව් එකක මුරපදයකින් ආරක්ෂිත PDF ලේඛනයක් ලෙස)
5. ඉදිරිපත් කිරීමේ ක්‍රමය : මුද්‍රා, තැබූ කවරයක බහා ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.
6. ඉදිරිපත් කිරීමේ අවසාන දිනය හා වේලාව : **2026 අගෝස්තු 10 වන දින ප.ව. 4.30 ට** හෝ ඊට පෙර.
7. EOI අඩංගු කවරයේ ඉහළ වම් පස කෙළවරේ "**Expression of Interest to Hire a Consultancy Firm to Undertake the Change Management, Communications and Capacity Building for TNSWSP**" ලෙස සටහන් කළ යුතුය.
8. ලිපිනය:

**සභාපති,**
**අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කාරක සභාව,**
**වෙළඳ ජාතික තනිකවුළු පද්ධති ව්‍යාපෘතිය,**
**219A, දෙවන මහල, දෙවන පරිශ්‍රය, BMICH,**
**බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

**දුරකථන : 011 269 6947**
**විද්‍යුත් තැපෑල : nsw@tipd.treasury.gov.lk**
**වෙබ් අඩවිය : www.onetrade.lk**